**ජාතික හෙළ උරුමය හෙළිදරව් වෙයි**

ජාතික හෙළ උරුමයේ ක්‍රියා කලාපය ගැන බොහෝ දෙනා කතාකර ඇත. එහෙත් මෙහි දී අපට අමතක කිරීමට බැරි චරිතය වනුයේ කතානායක ඡන්දයේ දී එම ඡන්දය නරක් කරගත් මන්ත්‍රීවරයා හෝ මන්ත්‍රීවරිය ය. ජාතික හෙළ උරුමයේ ඇතැමුන්ගේ පණ්ඩිතමානී තරක අප ද අනුගමනය කරන්නේ නම් ඡන්දය නරක් වන්නට ඇත්තේ සමහරවිට ආණ්ඩු පක්ෂය සමග එකතු වී සිටින බවක් කියන භික්ෂූන් වහන්සේලා දෙනමගෙන් එක් නමකගේ විය හැකි ය. ජාතික හෙළ උරුමයේ ඇතැමුන්ට අනුව ඡන්දය සම්බන්ධ කිසි දෙයක් නිශ්චිත ව කිව හැකි නො වෙයි. එහෙත් අප්‍රියෙල් මස 22වැනි දා පාර්ලිමේන්තුවේ දී ඡන්දය දුන් ජාතික හෙළ උරුමයේ මන්ත්‍රීවරු හතරනමගෙන් දෙනමක් ආණ්ඩු පක්ෂ සමග ඡන්දය දී ඇත යන පදනමෙන් අනෙක් හාමුදුරුවරු දෙනම විපක්ෂය සමග තම ඡන්දය දුන්හ. ඒ දෙනම එසේ ආණ්ඩුව සමග ඡන්දය දුන් බව අනෙක් මන්ත්‍රී හාමුදුරුවරුන් නිශ්චිත ව දැනගත්තේ කෙසේ දැයි උන්වහන්සේලා (අනෙක් මන්ත්‍රී හාමුදුරුවරු) නොකියති. කෙසේ වෙතත් ඡන්දය නරක් කරගත් මන්ත්‍රීවරයාට (ජාතික හෙළ උරුමයේ ඇත්තන්ගේ පණ්ඩිතමානී කතාවලට අනුව ඒ මන්ත්‍රී හාමුදුරුනමක් ද විය හැකි ය.) අපේ කෘතඥතාව හිමිවිය යුතු ය. ඒ එතුමා ජාතික හෙළ උරුමයේ බොරු අපක්ෂපාතීකම්, මධ්‍යස්ථභාවයේ සිල් රෙදි (ජාතික හෙළ උරුමය යනු ගිහියන්ගේ නායකත්වයෙන් යුත් පක්ෂයකි. එබැවින් පක්ෂය ගැන කතාකරන විට සිල් රෙදි ගැන කතාකළ යුතු ය.) ගලවා දැමීමට සමත් වූ හෙයිනි. එතුමා නොවන්නට මන්ත්‍රී හාමුදුරුවරුන්ට තවදුරටත් මධ්‍යස්ථභාවයක් ආරූඪකරගනිමින් සිටින්නට හැකිවීමට තිබුණි. එහෙත් අද ඒ සියල්ල අවසන් ය. මැතිවරණයෙන් සති තුනක් ඇතුළත ම ජාතික හෙළ උරුමය සේවය කරන්නේ එ ජා පක්ෂයට බව ඒ පක්ෂයේ සිටින ඇතැමුන්ට හැරෙන්නට අනෙක් සියළු දෙනාට වැටහී ඇත. ජාතික හෙළ උරුමය පිටුපස ඇත්තේ විජාතික බලවේග බව අපි මුල සිට ම කීවෙමු.

එහෙත් මෙයින් කියවෙන්නේ සංඝයා වහන්සේට විරුද්ධව දියත්කර ඇති විවිධ ක්‍රියාකාරකම් අප අනුමත කරන බව නො වෙයි. භික්ෂූන් වහන්සේලා පාර්ලිමේන්තු දේශපාලනයට අවතීර්ණ වීමෙන් උන්වහන්සේලා කෙරෙහි ජනතා අප්‍රසාදයක් ඇතිකිරීමට මෙන්ම සිංහල බෞද්ධයන් සම්බන්ධයෙන් උන්වහන්සේලාගේ ඇති බලපෑම ද අඩුකිරීමට ද කටයුතු කෙරෙන බව අපි කල් ඇතිව කීවෙමු. භික්ෂූන්වහන්සේ පාර්ලිමේන්තුවට ගිය පමණින් අනෙක් මන්ත්‍රීන් සිල්වතුන් උපාසකයන් වේ යැයි කිසිවිටෙකත් අපි නො කියමු. උන්වහන්සේලාට මේ පරාජිත දේශපාලනය යහමගට දැමිය හැකි ද නො වෙයි. මෙවර මහා මැතිවරණයේ දී ප්‍රචණ්ඩ ක්‍රියා අඩුවූයේ භික්ෂූන් වහන්සේ තරග කළ නිසා යැයි ජාතික හෙළ උරුමයේ අවස්ථාවාදී බලලෝභී නායකයෙක් ප්‍රකාශ කර සිටියේ ය. ඔහු ඒ බව ලියා අතගැනීමටත් පෙර පාර්ලිමේන්තුවේ විනය අන්තයට ම පිරිහී ගියේ භික්ෂූන් වහන්සේ සභා ගැබේත් මේ අසත්‍යවාදී දේශපාලනඥයා පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේත් සිටින අතර ය. මැතිවරණයේ දී ප්‍රචණ්ඩ ක්‍රියා අඩුවූයේ පොලිසියේත් මැතිවරණ කොමසාරිස්වරයාගේත් කාර්ය නිසි ලෙස කිරීමට ඔවුන් උත්සාහගත් බැවින් මිස වෙනත් කරුණක් නිසා නොවන බව දැන්වත් මේ අවස්ථාවාදියා පිළිගනී යැයි මම නො සිතමි. භික්ෂූන් වහන්සේ පාර්ලිමේන්තුවට යෑම නිසා සිදුවන්නේ අනෙක් මන්ත්‍රීන් උපාසකයන්වීම නොව මන්ත්‍රී හාමුදුරුවරුන් ද අනෙක් මන්ත්‍රීන් මෙන් ම පරාජිත පාර්ලිමේන්තු දේශපාලනයේ නිරතවීම ය.

අපි කතානායක ඡන්දයේ දී සිදුවූයේ කුමක් දැයි පැහැදිලි කරගනිමු. ඒ ඡන්දයට පෙර දෙව්රම් වෙහෙරෙහි සහ වෙනත් තැන්වල රැස් වූ ජාතික හෙළ උරුමයේ නායකයන් (මෙහි නායකයෝ ගිහියෝ වෙති. ඒ බවට මැතිවරණ කොමසාරිස්වරයා සාක්ෂි දරනු ඇත. මහා සංඝයා වෙනුවෙන් ප්‍රකාශ නිකුත් කරන උත්තරීතර සංඝ සභාව මැතිවරණ කොමසාරිස්වරයා විසින්වත් මහානායක ස්වාමීන්වහන්සේලා ප්‍රමුඛ එක් නිකායක් විසින්වත් පිළිගැනෙන ආයතනයක් නො වෙයි. මේ සංඝ සභාව මහා සංඝයා වහන්සේ වෙනුවෙන් පෙනී සිටින බවටත් කරන හැඟවීම නිසා සංඝයා වහන්සේ කෙරෙහි ම අප්‍රසාදයක් ඇති කිරීමට ද විජාතික බලවේග බලාපොරොත්තුවෙන් සිටියි.) ලොකුබණ්ඩාර මහතාට සහයෝගය දිය යුතු බවට තීරණය කර ඇතැයි යනුවෙන් පැතිර යන කතා අපි අමතක කරමු. පාර්ලිමේන්තුවේ සන්ධානයට ඩග්ලස් දේවානන්ද මහතා ද ඇතුළුව ඡන්ද 106ක් වෙයි. මන්ත්‍රී හාමුදුරුවන් 9නම ද හැරුණුකොට ඡන්ද බලය හිමි තවත් මන්ත්‍රීවරු 110ක් වෙති. මේ මන්ත්‍රීවරු 110 දෙනාගෙන් කරුණාව පක්ෂපාත යැයි කියන මන්ත්‍රීවරයා අයින්කළ ද තවත් මන්ත්‍රීවරු 109ක් වෙති. එ ජා පක්ෂය හා අනෙක් විජාතික බලවේග ලොකුබණ්ඩාර මහතාට මේ ඡන්ද 109 ලැබේ යැයි බලාපොරොත්තු වූ බව පැහැදිලි ය.

© Prof. Nalin De Silva

ජාතික හෙළ උරුමයෙන් පත් වී පැහැරගෙන යනු ලැබුවේ යැයි ජාතික හෙළ උරුමයේ ඇත්තන් කියන හාමුදුරුවරු දෙනම ආණ්ඩු පක්‍ෂය සමග එක්වී ඡන්දය පාවිච්චි කළ ද ඩිව් ගුණසේකර මහතාට ලැබෙන්නට තිබුණේ ඡන්ද 106 + 2= 108ක් පමණකි. එනම් ලොකුබණ්ඩාර මහතාට ඡන්ද 109ක් ලැබෙන විට ගුණසේකර මහතාට ලැබෙන්නට තිබුණේ ඡන්ද 108ක් පමණකි. ඒ අනුව කරුණාට පක්‍ෂ යැයි කියන මන්ත්‍රීවරයා හැරෙන්නට අනෙක් මන්ත්‍රීවරු සියළු දෙනා අප්‍රියෙල් 22වැනි දා පාර්ලිමේන්තුවට පැමිණියේ නම් ජාතික හෙළ උරුමයේ ඉතිරි මන්ත්‍රී හාමුදුරුවරු 7 නම ඡන්දය පාවිච්චි නොකළ ද ලොකුබණ්ඩාර මහතා කතානායක ලෙස පත්වීම ඒ අනුව ස්ථිර කරුණක් විය. මේ තත්ත්වය උඩ එදින තරගයේ දී ඡන්දය දීමෙන් වැළකී සිටීමට මන්ත්‍රී හාමුදුරුවරු තීරණය කර තිබුණි. අපි ඉතා පැහැදිලිව එක් කරුණක් කියමු. දෙව්රම් වෙහෙරේ හා වෙනත් තැන්වල පැවැත්වුණේ යැයි කියන සාකච්ඡා කෙසේ වෙතත් ජාතික හෙළ උරුමයට හා මන්ත්‍රී හාමුදුරුවන්ට අවශ්‍ය වී තිබුණේ ලොකුබණ්ඩාර මහතා දිනවීම ය. ඒ බව උන්වහන්සේ එදා කටයුතු කර ඇති ආකාරයෙන් පැහැදිලි වෙයි. එල්ලාවල මේධානන්ද හිමියන් පසුව පුවත්පත් සාකච්ඡාවක දී පැවසුවේ ජාතික හෙළ උරුමය ආණ්ඩු පක්‍ෂය සමග ඡන්දය දීමට සිටි බවත් එහෙත් ඊනියා පැහැරගෙන යෑම නිසා උන්වහන්සේට වෙනත් තීරණයක් ගැනීමට සිදු වූ බවත් ය. මේ අළුත් කතාවකි. ඒ කතාව අනෙක් එක් කතාවක් සමග හෝ සංගත නො වෙයි. අනෙක් කතාවලින් කියැවුණේ මන්ත්‍රී හාමුදුරුවන් ඡන්දය දීමෙන් වැළකීමට තීරණය කර තිබූ බව ය. මේධානන්ද හිමියන්ගේ කතාවෙන් පැහැදිළි වන්නේ මන්ත්‍රී හාමුදුරුවන් ද අනෙක් මන්ත්‍රීවරුන් මෙන් ම කතා වෙනස් කරන බව ය.

ලොකුබණ්ඩාර මහතා දිනන බව ඒ ජා පක්‍ෂයේ මෙන් ම කොට් නියෝජිත මන්ත්‍රීන්ගේ ද අෂ්රොෆ් කොන්ග්‍රසයේ ද තොණ්ඩමන් කණ්ඩායමේ ද ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී 7 නමකගේ ද නිගමනය වුව ද එයට පටහැණිව යම් ක්‍රියාවලියක් සිදු වී තිබුණු බව ඡන්ද විමසීමේ දී අනාවරණය විය. ඡන්ද විමසීමේ පළමු වටයේ දී ලොකුබණ්ඩාර මහතාට අපේක්ෂිත පරිදි ඡන්ද 109ක් නොලැබුණි. ඒ මහතාට ඡන්ද 108ක් පමණක් ලැබුණු අතර එක් ඡන්දයක් නරක් වී තිබුණි. ඒ ඡන්දය ජාතික හෙළ උරුමය ඇත්තන්ගේ විධික්‍රමයට අනුව නම් කාගේ දැයි කීමට නොහැකි ය. ඒ නිසැකයෙන් ම ඒ ඡන්දය කාගේදැයි නොදන්නා නිසා ය. එය පැහැරගෙන යනු ලැබුවේ යැයි කියන භික්‍ෂුන් වහන්සේ නමකගේ ද විය හැකි ය. ජාතික හෙළ උරුමයේ භික්‍ෂුන් වහන්සේ නිසැක සාධක නොමැතිව සැකය නිසා දේශපාලන තීන්දු නොගන්නේ යැයි එක් මන්ත්‍රී හාමුදුරුනමක ප්‍රකාශ කර තිබුණි. එහෙත් උන්වහන්සේලා අර භික්‍ෂුන්වහන්සේ දෙනම ඡන්දය දුන්නේ කාහටදැයි නිශ්චිත ව දැනගෙන ඇත. එසේ දැනගත්තේ පරචිත්ත විජානන චිත්තයෙන් දැයි ජාතික හෙළ උරුමයේ විශ්‍රාම ලත් මහාචාර්යවරයකුගෙන් ඇසිය යුතු ව ඇත.

ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී හාමුදුරුවරුන් කුමක් කීව ද, ඡන්දය නරක් වූයේ ඒ ජා ප හෝ එයට හිතවත් ව සිටි වෙනත් මන්ත්‍රීවරයකුගේ ය. ඒ ජා පක්‍ෂය හා ලොකුබණ්ඩාර මහතාගේ ජය පැතූ මන්ත්‍රී හාමුදුරුවරුන් නොදැන සිටිය ද ලොකුබණ්ඩාර මහතාට ඡන්දය දීමට සිටි එක් මන්ත්‍රීවරයකු ආණ්ඩු පක්‍ෂයේ කිහිප දෙනකු සමග සාකච්ඡා පවත්වා යම්කිසි එකඟතාවයකට පැමිණ තිබූ බව පැහැදිලි ය. ඒ එකඟතාවය මත ඒ මන්ත්‍රීවරයා ඩිව් ගුණසේකර මහතාට ඡන්දය දීමට සිටි මුත් යම් හේතුවක් නිසා ඔහු (ඇය වීමට ද ඉඩ ඇති මුත් වඩා සම්භාවිතාවක් ඇත්තේ ඔහු වීමට ය.) ඡන්ද පත්‍රිකාවේ ලියා ඇත්තේ විජමු ගුණසේකර කියා ය. එබැවින් ඒ ඡන්දය ප්‍රතික්‍ෂෙප විය. එහි ප්‍රතිඵලය වූයේ ලොකුබන්ඩාර මහතාට ද ඡන්ද 108ක් ලැබී තරගය ජය පරාජයකින් තොරව කෙළවර වීම ය. දැන් දෙවන වටයක් අවශ්‍ය විය. දෙවන වටයේ දී ඡන්දය නරක් කරගත් මන්ත්‍රීවරයාගේ ඡන්දය ලොකුබණ්ඩාර මහතාට ලකුණු කරගැනීමේ අවශ්‍යතාවය ඒ ජා පක්‍ෂයට විය. ඒ කිරීමට එක් මගක් වූයේ ඒ ඒ මන්ත්‍රීවරයාට ඡන්ද පත්‍රිකාව පෙට්ටියට දැමීමට පෙර එය නායකයාට පෙන්වීමට බලකිරීම ය. ඒ අරමුණින් ඒ ජා ප මන්ත්‍රීවරු ඡන්ද පත්‍රිකාව පෙන්වා පෙට්ටියට දැමීමට පටන්ගත්හ. එය ස්ථාවර අණපණත්වලට පටහැණි වූයෙන් ආණ්ඩු පක්‍ෂයේ උද්ඝෝෂණ මැද ඒ ක්‍රියාවලිය නතරකිරීමට සිදුවිය.

ඉන්පසු තුන්වැනි වටයක් ආරම්භ කිරීමට සිදු විය. ඒ වටය තීරණාත්මක විය. නරක් වූ ඡන්දය තුන්වැනි වටයේ දී නරක් නොවන බවත් එය ඩිව් ගුණසේකර මහතාට ලැබෙන බවත් පැහැදිලි විය. (ජාතික හෙළ උරුමයට අනුව නම් ඒ නිසැකයෙන් කිව නොහැකි ය. එබැවින් සැකය මත පිහිටා කටයුතු නොකරන්නේ යැයි කියන ඔවුන්ට තීන්දුවක් ගැනීමේ හැකියාවක් නොතිබුණි.) ඒ අනුව ඩිව් ගුණසේකර මහතාට ඡන්ද 109ක් හා ලොකුබණ්ඩාර මහතාට ඡන්ද 108ක්

© Prof. Nalin De Silva

ලැබීමට තිබුණි. ගුණසේකර මහතා ජයගැනීමට තිබුණු බැවින් එය නැවැත්විය යුතුව තිබුණි. ඒ නැවැත්විය හැකි පහසුම ක්‍රමය වූයේ මන්ත්‍රී හාමුදුරුවරු අඩුම තරමින් දෙනමක් ලොකුබණ්ඩාර මහතාට ඡන්දය දීම ය. එසේ ඡන්දය දීම සාධාරණයකිරීමේ අවශ්‍යතාවක් ද විය. ඒ දෙකම කළ හැකි ආකාරය වූයේ මන්ත්‍රී හාමුදුරුවරු දෙනමක් ලොකුබණ්ඩාර මහතාට ඡන්දය දී ඊනියා නිෂ්ක්‍රීයකරණයක් සඳහා එසේ ඡන්දය දුන් බව ප්‍රකාශ කිරීම ය. ලොකුබණ්ඩාර මහතාගේ ජයග්‍රහණය සිදුවූයේ ඒ ආකාරයට ය.

ඡන්ද නිෂ්ක්‍රීයකරණය ගැන ද යමක් කිව යුතු ය. නිෂ්ක්‍රීයකරණය කළ යුතුව තිබුණේ පළමු වටයේ දී ම ය.  හෙළ උරුමයේ ඇත්තන් අද පවසන්නේ පළමු වටයේ දී ම නිෂ්ක්‍රීය නො කෙළේ  අර පැහැරගෙන යනු ලැබුවේයැයි කියන භික්ෂූන් වහන්සේලා කාට ඡන්දය දෙන්නේ දැයි සැකයකින් තොරව කීමට නොහැකි වූ බැවින් ඡන්දය දීමට පෙර නිෂ්ක්‍රීයකිරීමේ අවශ්‍යතාවක් පැන නොනැගුණු බව ය. මේ කතා බොරු පණ්ඩිතයන්ට නම් හොඳ ය. අපේ ජීවිතයේ විවිධ අවස්ථාවල අප තීරණ ගන්නේ සැකයකින් තොරව කරුණු මත පිහිටා නො වෙයි. අප තීරණ ගන්නේ අනෙක් අය කරන්නට යන්නේ කුමක්දැයි පරචිත්ත විජානනයෙන් දැනගෙන නො වෙයි. විවිධ සාධක උඩ විවිධ දේ සිදුවීමේ සම්භාවිතාවන් ගැන අපි දනිමු. දේශපාලනයේ දී කියා මෙහි වෙනසක් නැත. කිසිම සැකයකින් තොරව ම යම් යම් දේ දැනගැනීමට සිටියහොත් තීරණ රාශියක් ගැනීමට නොහැකි වනු ඇත. හැරත් දේශපාලනයේ දී වඩා වැදගත් වන්නේ සිද්ධියකින් පසුව යමක් දැනගැනීම නොව ඒ සිදුවීමට කලින් ඒ ගැන දැනගැනීම ය. එසේ දැනගැනීමට නොහැකි අය දේශපාලන නායකත්වයට සුදුසු නො වෙති. පැහැරගෙන යනු ලැබුයේ යැයි කියන භික්ෂූන් වහන්සේ ඡන්දය දෙන්නේ කාහටදැයි දැනගැනීමට පරචිත්ත විජානන චිත්ත අවශ්‍ය වන්නේ විශ්‍රාමලත් මහාචාර්යවරුන්ට විය හැකි ය. ඒ භික්ෂූන් වහන්සේ ඡන්දය දෙන්නේ කාටදැයි දැනගැනීමට ජාතික  හෙළ උරුමයට කල්තබා නොහැකි වී නම් ඔවුහු දේශපාලන නායකත්වයකට සුදුසු නො වෙයි. ඔවුන් කොටි සම්බන්ධයෙන් ද ක්‍රියාකිරීමට සිද්ධි අවසාන වන තෙක් සිටිනු ඇත.

අනෙක් අතට ඒ භික්ෂූන්වහන්සේ පැහැරගෙන ගිය බව නිශ්චිතව ම ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී හාමුදුරුවරුන් දන්නේ කෙසේ ද? පැහැරගෙන ගියේ යැයි කියන භික්ෂූන් වහන්සේට අනුව ඇතැම් පුද්ගලයන්ගෙ හිරිහැරවලින් බේරීමට උන්වහන්සේ විවිධ පන්සල්වල වැඩවාසය කර ඇත. උන්වහන්සේ පාර්ලිමේන්තුවට වැඩම කෙළේ සන්ධානයේ (ජනතා විමුක්ති පෙරමුණේ) ආධාරයෙන් යැයි කියමු. ජාතික හෙළ උරුමයේ ඊනියා නිසැක විධික්‍රමය අනුව උන්වහන්සේ පැහැරගෙන හොස් තිබූ බව ඉන් ගම්‍ය වෙයි ද? වැඩිම වුවහොත් ඉන් ගම්‍ය වන්නේ ඒ භික්ෂූන් වහන්සේ දෙනම සන්ධානයට හිතවත් බව ය. ජාතික හෙළ උරුමය වෙනස් දේශපාලනයක් කරන්නේ යැයි කීව ද ඔවුන්ට ද ඇත්තේ කබරගොයි තලගොයි තර්කක්‍රමය ය.

ජාතික හෙළ උරුමයේ ඊනියා නිසැක විධික්‍රමයට එකඟව පළමු වටයේ දී ඡන්දය දීමෙන් වැළකී සිටියේ යැයි කියමු. යම් අයුරකින් පළමු වටයේ ම තරඟය නිම වූයේ නම් ජාතික හෙළ උරුමයේ නායකත්වයේ බංකොළොත් බව එවෙලෙහි ම හෙළිදරව් වීමට තිබුණි. පළමු වටය අවසානයේ අර භික්ෂූන් වහන්සේ දෙනම ආන්ඩුව සමග ඡන්දය දී ඇති බව  දැනගැනීමෙන් පසු ඒ නිෂ්ක්‍රීයකිරීමේ අවස්ථාවක්  නොලැබෙන බැවිනි. නරක් වූ ඡන්දය ද ඩිව් ගුණසේකර මහතාට ලැබිණි නම් ඒ මහතා කතානායක වීමට තිබුණි. බෝම්බ මෙන් ම ඡන්ද ද නිෂ්ක්‍රීය කළ යුතු වන්නේ ඡන්දයේ (බෝම්බයේ) ප්‍රතිඵල ලැබීමට පෙර මිස පසුව නො වෙයි.

මෙහි තවත් පැත්තක් ද වෙයි. නිෂ්ක්‍රීය යන සංකල්පය ම මෙහි දී කෙතරම් වලංගු ද යන්න ය. අනෙක් භික්ෂූන් වහන්සේ දෙනම තවදුරටත් ජාතික හෙළ උරුමයේ විනයට යටත් නැත. උන්වහන්සේ කටයුතු කරන්නේ සන්ධානයත් සමග ය. ඒ උන්වහන්සේගේ තීරණය වෙයි. උන්වහන්සේ කටයුතු කරන ආකාරය වැරදි ද නිවැරදි ද යන්න ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කෙරිය යුතු ව ඇත. උන්වහන්සේ කිසිම දිනක ජාතික හෙළ උරුමයේ සාමාජිකයන් වී දැයි මම නොදනිමි. පක්ෂ කණ්ඩායමකින් තරගකිරීමට පක්ෂයක සාමාජිකයකුවීම අනිවාර්ය නොවන බව මම අත්දැකීමෙන් දනිමි. උන්වහන්සේ පක්ෂයේ සාමාජිකයන් වී නොමැති නම් පක්ෂයේ ලේකම්වරයාට (ඔහු ගිහියකු බව අමතක නොකළ යුතු ය) හා පක්ෂයට කළ හැක්කේ කුමක් ද? උන්වහන්සේ පක්ෂ සාමාජිකයන් නම් පක්ෂයෙන් අස්කර නීතිප්‍රකාර ව කටයුතු කළ හැකි ය. කෙසේ වෙතත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන තුරු උන්වහන්සේ ස්වාධීන ව මන්ත්‍රීවරුන් ලෙස කටයුතු කරනු ඇත. උන්වහන්සේ ජාතික හෙළ උරුමයෙන් පත්වීණි යැයි කියා උන්වහන්සේගේ ඡන්ද නිෂ්ක්‍රීය කිරීමට ජාතික හෙළ උරුමයට අයිතියක් හෝ හැකියාවක් හෝ නැත. මින්පසු ජාතික හෙළ උරුමය

© Prof. Nalin De Silva

ඡන්දය දීමෙන් වැළකී සිටින අවස්ථාවල උන්වහන්සේ දෙනම යම් පණතකට පක්ෂව ඡන්දය දෙන්නේ නම් ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී හාමුදුරුවන් දෙනමක් ඒ පණතට විරුද්ධව ඡන්දය දෙන්නේ ද? එය එසේ කෙළේ යැයි සිතමු. එහෙත් යම් පණතකට විරුද්ධව ඡන්දය දීමට ජාතික හෙළ උරුමය තීරණය කර එසේ ඡන්දය දෙනවිට අර භික්ෂුන් වහන්සේ දෙනම පණතට පක්ෂව ඡන්දය දෙන්නේ නම් එවිට ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී හාමුදුරුවන් කරන්නේ කුමක් ද? පණතට විරුද්ධව ජාතික හෙළ උරුමයේ ඇත්තන්ට අනුව ඡන්ද 9ක් ජාතික හෙළ උරුමයෙන් ලැබිය යුතුවිට ලැබෙන්නේ ඡන්ද 7ක් පමණකි. එපමණක් නො වෙයි. ඡන්ද දෙකක් පණතට පක්ෂව ද ලැබෙයි. එහි ශුද්ධ ප්‍රතිඵලය වනුයේ පණතට විරුද්ධව ජාතික හෙළ උරුමයෙන් (ජාතික හෙළ උරුමය ඇත්තන්ගෙ කණ්ඩායම් සංකල්පය අනුව) ඡන්ද 5ක් පමණක් ලැබීම ය. ඡන්ද නිෂ්ක්‍රීය කිරීමට කියා කතානායකතුමා මන්ත්‍රී හාමුදුරුවන් කිහිප නමකට වැඩිපුර ඡන්ද ලබා දෙන්නේ ද? මේ නිෂ්ක්‍රීය සංකල්පය ම අසංගත පුහු සංකල්පයකි.

ජාතික හෙළ උරුමය කණ්ඩායම් සංකල්පයට අනුව පළමු වටයේ දී නිෂ්ක්‍රීය නොවී ඩිව් ගුණසේකර මහතාට ජාතික හෙළ උරුමයෙන් ඡන්ද දෙකක් ලැබී ඇත. මේ කණ්ඩායම් සංකල්පය ද වැරදි ය. පී. එල්. පීරිස්, බන්දුල ගුණවර්ධන ආදීන් එ ජා පෙරමුණ සමග සම්බන්ධ වූ පසු ඔවුන් තවමත් පොදු පෙරමුණේ කණ්ඩායමේ යැයි සලකමින් කටයුතු කිරීමට එවකට ඉඩක් නො තිබුණි. අද ද තත්ත්වය එසේ ම ය. කළ හැකි උපරිමය නම් හැකිනම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මගින් ඒ භික්ෂුන් වහන්සේ දෙනමගෙ මන්ත්‍රී ධුර අහෝසිකිරීම පමණ ය.

මේ සියල්ල තර්ක පමණක් යැයි කාහට හෝ කීමට හැකි ය. ඒ සියල්ල අපි අමතක කරමු. ඊනියා ඡන්ද නිෂ්ක්‍රීයකිරීම පළමු වටයේ දී ම නොකෙළේ ඇයි? පැහැරගෙන ගියේ යැයි කියනු ලබන භික්ෂුන් වහන්සේ නමක් වන අපරැක්කේ පඤ්ඤානන්ද හිමියන්ට අනුව උන්වහන්සේ හා කතළුවේ රතනසීහ හිමියන් එ ජා පක්ෂය පැරදවීමට ඡන්දය දෙන බව අප්‍රියෙල් මස 22 වැනි දින උදෑසන ම අතුරලියේ රතන හිමියන්ට දන්වා ඇත. රතන හිමියන් එදා පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයක් කරමින් පළමු වටයට ම පෙර කියා සිටියේ ජාතික හෙළ උරුමයේ 7නමක් පමණක් ඡන්දය දීමෙන් වැළකී සිටින බවත් අනෙක් දෙනම ගැන වගකීමක් නැති බවත් ය.

ඉතා පැහැදිලිව ම ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී හාමුදුරුවරු මෙන් ම ඇත්තන් ද අර භික්ෂුන් වහන්සේ දෙනම ආණ්ඩු පක්ෂය සමග ඡන්දය දෙන බව පළමු වටය ආරම්භයේත් දැන සිටියහ. එහෙත් ඒ වටයේ ඡන්ද නිෂ්ක්‍රීයකිරීම අවශ්‍ය නොවූයේ ඒ ඡන්ද දෙක ආණ්ඩුවට ගිය ද ලොකුබණ්ඩාර මහතා දිනන බව ජාතික හෙළ උරුමය නිගමනය කර සිටි බැවින් ය. ඡන්දය දීමෙන් වැළකුණු බව ලෝකයාට ප්‍රකාශ කරමින් තමන් ලොකුබණ්ඩාර මහත්ගෙ ජයග්‍රහණයට ආශිර්වාද කළ බව වසාගැනීමට ජාතික හෙළ උරුමයට අවශ්‍ය වී තිබුණි. එහෙත් අර ඡන්දය නරක් කරගත් මන්ත්‍රීවරයා ඒ සියල්ල අවුල් කෙළේ ය. සියළු ගාම්භීර කතා පිටුපස තිබුණේ ජාතික හෙළ උරුමයට ලොකුබණ්ඩාර මහතා ජයග්‍රහණය කරවීමේ අවශ්‍යතාව ය. පාර්ලිමේන්තුවේ පළමු දිනයේ දී ම ජාතික හෙළ උරුමය හෙළිදරව් විණි. එහි දී ඡන්දය නරක් කරගත් මන්ත්‍රීවරයාට විෂ්ණු (උපුල්වන්) දෙවියන් ආරූඪ වී යැයි යමකු කියන්නේ නම් මම ඒ පුද්ගලයා සමග තර්ක කිරීමට නොයමි.

© Prof. Nalin De Silva